සියලුම හිමිකම් ඇවිරිණි.

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, පෙරහුරු පරීක්ෂණය- 2025(2026)**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**

**60 | S | I,II**

**පැය තුනයි**

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

උපදෙස්:

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකය සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- ලිලී වික්‍රමසිංහ අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් පසු රූපලාවන්‍ය පාඨමාලාවක් සාර්ථකව නිමකළ පසු 'ලිලී සැලෝන්' නමින් ව්‍යාපාර ආයතනයක් නගර මධ්‍යයේ බස් නැවතුම්පොළ අසල කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදී. ඉහළ ගුණත්වයෙන් යුත් සේවාවක් සැපයීම නිසා ගනුදෙනුකරුවන්ගේ ඉහළ ඉල්ලුමක් පවතී. ඇගේ මිතුරියක් වන මලී ව්‍යාපාරයේ සහායිකාවක් ලෙස බඳවා ගන්නා ලදී.

1. 'ලිලී සැලෝන්' ආයතනය අයත්වන ව්‍යාපාර සංවිධානය වන්නේ,
   (1) ඒක පුද්ගල ව්‍යාපාරයකි. (2) පුද්ගලික සමාගමකි.
   (3) සංස්ථාපිත සමාගමකි. (4) හවුල් ව්‍යාපාරයකි.

2. ඉහත සිද්ධියේ ඇතුළත් නිෂ්පාදන සාධක වන්නේ,
   (1) ශ්‍රමය, ප්‍රාග්ධනය, භූමිය (2) ප්‍රාග්ධනය, භූමිය, ව්‍යවසායකත්වය
   (3) ශ්‍රමය, ව්‍යවසායකත්වය, ප්‍රාග්ධනය (4) භූමිය, ශ්‍රමය, ව්‍යවසායකත්වය

3. 'ලිලී සැලෝන්' ආයතනයට අයත් අභ්‍යන්තර පරිසර සාධකයන් හා බාහිර පරිසර සාධකයන් අනු පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?
   (1) අයිතිකරු, ගනුදෙනුකරුවන් (2) අයිතිකරු, සේවකයා
   (3) ගනුදෙනුකරුවන්, අයිතිකරු (4) සේවකයා, අයිතිකරු

4. ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාරය නිෂ්පාදන ස්වාභාවය අනුව,
   (1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. (2) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.
   (3) ඒක පුද්ගල ව්‍යාපාරයකි. (4) සේවා සපයන ව්‍යාපාරයකි.

5. 'ලිලී සැලෝන්' නගර මධ්‍යයේ බස් නැවතුම්පොළ අසල ආරම්භ කිරීම ව්‍යාපාරයට,
   (1) ශක්තියකි. (2) දුර්වලතාවයකි.
   (3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

පහත තොරතුර භාවිතයෙන් අංක 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පසුගිය කාලය තුළ දී සිදුවූ ස්වාභාවික ආපදාවෙන් විපතට පත් වූවන් සඳහා 'සමඟි මිතුරු සමාජය' වියළි ආහාර මල්ලක් බෙදා දෙන ලදී.

6. ඉහත සිද්ධියට අනුව මතුවී ඇති මූලික මිනිස් අවශ්‍යතාව වන්නේ,
   (1) සෞඛ්‍ය ය.   (2) ආරක්ෂාව ය.
   (3) ප්‍රවාහනය ය.   (4) ආහාර ය.

7. "සමඟි මිතුරු සමාජය" අයත් වන ව්‍යාපාර සංවිධානය දැක්වෙන වරණය කුමක්ද?
   (1) ඒක පුද්ගල ව්‍යාපාරයකි.   (2) සමිති සංවිධානයකි.
   (3) හවුල් ව්‍යාපාරයකි.   (4) සේවා සපයන ව්‍යාපාරයකි.

8. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී පදනම් කරගනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායකයක් වන්නේ,
   (1) ව්‍යාපාරයේ කීර්තිනාමය යි.
   (2) ව්‍යාපාරයේ නිෂ්පාදනවල ස්වාභාවය යි.
   (3) ව්‍යාපාරයේ සේවක සංඛ්‍යාව යි.
   (4) ව්‍යාපාරයේ වගකීමේ ස්වාභාවය යි.

9. පහත සඳහන් කරුණු අතුරින්, ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රතිලාභ පමණක් ඇතුළත් වරණය කුමක්ද?
   A. - නෛතික පුද්ගලභාවයක් ලැබීම.
   B. - ව්‍යාපාරයේ නාමයේ අයිතිය තහවුරුවීම.
   C. - රජයෙන් ණය ලබාගැනීමට පහසුවීම.
   D. - රජයෙන් ලබාදෙන දිරිගැන්වීම් ලබා ගැනීමට සුදුසුකමක් වීම.

   (1) A, B, C   (2) B, C, D   (3) A, C, D   (4) A, B, D

10. දිලාන් සිල්වා තම ජංගම ගිණුම ලංකා බැංකුව - ගාල්ල ශාඛාවේ පවත්වාගෙන යන අතර, තරුෂ ප්‍රනාන්දු සමඟ කළ ගනුදෙනුවක දී ඔහුට ගෙවීමට අවශ්‍ය රු. 50 000 ක මුදල චෙක්පතකින් ගෙවන ලදී. තරුෂ ප්‍රනාන්දු තම ජංගම ගිණුම මහජන බැංකුව මාතර ශාඛාවේ පවත්වාගෙන යයි. මෙම සිදුවීමේ අන්තර්ගත අණලදු හා ආදායකයා අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?
    (1) තරුෂ ප්‍රනාන්දු, දිලාන් සිල්වා
    (2) ලංකා බැංකුව ගාල්ල ශාඛාව, දිලාන් සිල්වා
    (3) ලංකා බැංකුව ගාල්ල ශාඛාව, තරුෂ ප්‍රනාන්දු
    (4) මහජන බැංකුව මාතර ශාඛාව, තරුෂ ප්‍රනාන්දු

11. පහත ප්‍රකාශ අතුරින්, දේපල රක්ෂණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?
    (1) ඔප්පුවේ වටිනාකම රක්ෂිතයාගේ ගෙවීමේ හැකියාව මත තීරණය වේ.
    (2) මූල්‍ය ආයතනවලින් ණය ලබාගැනීමේ දී ඇපයක් ලෙස භාවිතා කළ හැකිවේ.
    (3) දේපළකට සිදු වූ හානිය යථා තත්ත්වයට පත් කිරීමට පමණක් වන්දි ගෙවයි.
    (4) ඉතිරි කිරීමේ ක්‍රමයක් ලෙස හෝ ආයෝජන මාර්ගයක් ලෙස යොදාගත හැකිය.

12. මහව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කුඩා ව්‍යාපාරිකයන් සඳහා වැඩමුළුවක් පැවැත්වෙන බව කුඩා ව්‍යාපාරයක් පවත්වාගෙන යන නිලූකා වෙත වට්ස්ඇප් (WhatsApp) පණිවිඩයක් ලැබී ඇත. මෙහි සඳහන් සන්නිවේදන මාධ්‍ය හා ක්‍රමය අනුපිළිවෙළින් දැක්වෙන්නේ,
    (1) වාචික, දුරකථන   (2) විද්‍යුත්, වට්ස්ඇප්
    (3) විද්‍යුත්, ලිඛිත   (4) වට්ස්ඇප්, විද්‍යුත්

13. කඳුකර ප්‍රදේශයේ නායයෑම්වලින් අවතැන් වූ ජනතාවට වියළි ආහාර බෙදාදීම සඳහා යොදාගත හැකි වඩාත්ම සුදුසු ප්‍රවාහන මාර්ගය හා ප්‍රවාහන මාධ්‍ය දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) මහා මාර්ග - ලොරි රථය (2) දුම්රිය මාර්ගය - දුම්රිය
(3) ගුවන් මාර්ගය - හෙලිකොප්ටරය (4) ජල මාර්ග - බෝට්ටු

14. නිර්මලා විසින් ළමා ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, රෙදි ඇතුළු අමුද්‍රව්‍ය ලබා ගන්නා ආකාරය තීරණය කිරීමත් අලෙවිකරණ කටයුතු සඳහා කළමනාකරුවෙකු පත් කිරීමත් ව්‍යාපාරය ආරම්භක දිනම සිදුකරන ලදී. මෙහි ඇතුළත් කළමනාකරණ කාර්යයන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) සැලසුම්කරණය, මෙහෙයවීම (2) සැලසුම්කරණය, සංවිධානකරණය
(3) සංවිධානකරණය, සැලසුම්කරණය (4) ජල මාර්ග - බෝට්ටු

15. ගෘහ භාණ්ඩ අලෙවිසැලක තොග අවසන් කිරීමේ සේල් යටතේ 2025 දෙසැම්බර් 20 සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලයේ දී නවීන පන්නයේ සෝෆා ගෘහ භාණ්ඩ මිලදී ගන්නා පාරිභෝගිකයන්ට 10% ක වට්ටමක් ලබාදීමට තීරණය කර ඇත. ඉහත සිද්ධියෙහි ඇතුළත් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් වන්නේ,

(1) මිල, වට්ටම් (2) නිෂ්පාදිතය, ස්ථානය
(3) නිෂ්පාදිතය, ප්‍රවර්ධනය (4) ප්‍රවර්ධනය, වට්ටම්

16. භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම හා සාමාන්‍ය කොටස් හි ආයෝජනය කිරීම යන ආයෝජන මාර්ග දෙකෙන්ම ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ,

(1) ලාභාංශ ආදායම් ලැබිය හැකිවීම.
(2) ප්‍රාග්ධන ලාභ උපයාගත හැකිවීම.
(3) ඕනෑම අවස්ථාවක දී මුදල් බවට පත්කළ හැකිවීම.
(4) ණය ලබාගැනීමේ දී ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කල හැකිවීම.

17. ගිණුම්කරණයේ අරමුණක් **නොවන්නේ** මින් කුමක්ද?

(1) ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේද යන්න දැන ගැනීම සඳහා
(2) සෑම ව්‍යාපාරයක්ම නීතිමය අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා
(3) කිසියම් දිනකට මූල්‍ය තත්ත්වය ගණනය කිරීම සඳහා
(4) ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීම සඳහා

18. පහත සඳහන් ගනුදෙනු තුළින් ව්‍යාපාරයේ හිමිකමට බලපාන ගනුදෙනුවක් වන්නේ,

(1) රු.500 000 ක බැංකු ණයක් ගැනීම.
(2) රු.80 000 ක උපකරණයක් මිලදී ගැනීම.
(3) රු. 20 000 ක් ණය හිමියන්ට ගෙවීම.
(4) රු. 5 000 ක පොළියක් සහිතව බැංකු ණය වාරිකය ගෙවීම.

19. ගනුදෙනු නිසා ගිණුම්කරණයේ ජනිත වන්නේ පහත කවරක්ද?

(1) හිමිකම (2) ශේෂ පිරික්සුම
(3) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (3) ගැනුම් ජ'නලය

20. සිරිමල් ලී බඩු වෙළෙඳසැලක් පවත්වාගෙන යයි. ඔහු කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා රු. 100 000 ක් වටිනා ලී බඩු ණයට මිලදී ගැනීම සටහන් කිරීම සඳහා යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත් නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?

(1) ගෙවීම් වවුචරය හා මුදල් පොත
(2) ජ'නල් වවුචරය හා පොදු ජ'නලය
(3) ගැනුම් ඉන්වොයිසිය හා ගැනුම් ජ'නලය
(4) විකුණුම් ඉන්වොයිසිය හා විකුණුම් ජ'නලය

පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 21 සිට 23 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුමාරගේ ව්‍යාපාරයේ 2025/12/01 දිනට මූලික ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

| වත්කම් | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|
| රු.800 000 | = | රු. 500 000 | + | රු. 300 000 |

පහත සඳහන් ගනුදෙනු දෙසැම්බර් මාසය තුළ සිදු වී ඇත.

A. රු. 25 000 ක බඩු තොගයක් ණයට ගැනීම.
B. රු. 10 000 ක බඩු තොගයක් රු. 15 000 කට ණයට විකිණීම.
C. රු. 3 000 ක විදුලි ගාස්තු ගෙවීම.
D. රු. 50 000 ක උපකරණ මිලදී ගැනීම.

21. ඉහත ගිණුම්කරණ සමීකරණයේ මූලික අංගවල වටිනාකම වෙනස් **නොවන** ගනුදෙනුව වන්නේ කවරක්ද?

(1) A (2) B (3) C (4) D

22. ඉහත ගනුදෙනු ඇසුරෙන් කුමාරගේ ව්‍යාපාරයේ හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනු මොනවාද?

(1) A හා B (2) B හා C (3) A හා C (4) A හා D

23. කුමාරගේ ව්‍යාපාරයේ ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට යෙදීමෙන් පසු එහි නිවැරදි වටිනාකම දැක්වෙන පිළිතුර කුමක්ද?

| | වත්කම් | | හිමිකම් | වගකීම් |
|---|---|---|---|---|
| (1) | රු. 827 000 | = | රු. 527 000 + | රු. 300 000 |
| (2) | රු. 827 000 | = | රු. 505 000 + | රු. 322 000 |
| (3) | රු. 827 000 | = | රු. 502 000 + | රු. 325 000 |
| (4) | රු. 777 000 | = | රු. 477 000 + | රු. 300 000 |

24. මලිඳුගේ ව්‍යාපාරයේ 2025/12/31 දිනට සුළු මුදල් ශේෂය රු. 800 කි. 2026 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම වන්නේ රු. 5 400 කි. 2026 ජනවාරි මාසය අවසානයේ අග්‍රිමය රු. 500 කින් වැඩි කිරීමට තීරණය කර ඇත. ජනවාරි මාසයේ අවසාන දිනට ප්‍රතිපූර්ණය කළයුතු මුදල වන්නේ,

(1) රු. 5 100 කි (2) රු. 5 400 කි. (3) රු. 5 600 කි. (4) රු. 5 900 කි.

25. 2025/12/31 දිනට ව්‍යාපාරයක බැංකු ගිණුමේ ශේෂය රු. 17 800 කි. එදිනට ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය වන්නේ රු. 19 800 කි. මෙම වෙනසට බලපා ඇති හේතුව වන්නේ,

(1) ස්ථාවර නියෝග අනුව කළ රක්ෂණ ගාස්තු ගෙවීම රු. 2 000 කි.
(2) තැන්පත් කල නමුත් උපලබ්ධි නොවු චෙක්පත් රු. 2 000 කි.
(3) බැංකුව අයකල බැංකු ගාස්තු හා චෙක්පත් ගාස්තු රු. 2 000 කි.
(4) නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවු චෙක්පත් රු. 2 000 කි.

26. ණයගැතියෙකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කරන ලද රු. 6 000 ක චෙක්පත අගරුවීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) බැංකු ගිණුම - හර රු. 6 000, ණයගැති ගිණුම - බැර රු. 6 000
(2) ණයගැති ගිණුම - හර රු. 6 000, බැංකු ගිණුම - බැර රු. 6 000
(3) ණයගැති ගිණුම - හර රු. 6 000, මුදල් ගිණුම - බැර රු. 6 000
(4) මුදල් ගිණුම - හර රු. 6 000, බැංකු ගිණුම - බැර රු. 6 000

27. ව්‍යාපාරයක භාණ්ඩ ණයට විකිණීමේ දී 10% ක වෙළඳ වට්ටම් ලබාදීම සහ විකුණුම් ඉන්වොයිසිය තුළ 5% ශුද්ධ 60 යන කොන්දේසිය ද ඇතුළත් කර ඇත.

2025/12/01 දින ලකුණු කළ මිල රු. 50 000 ක භාණ්ඩ ණයට විකුණන ලදී. 2025/12/31 දින ණයගැතියා විසින් ණය මුදල පියවන ලදී. ණයගැතියා විසින් ලබාදුන් මුදල හා දුන් වට්ටම පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1) රු. 42 750 හා රු. 2 250 (2) රු. 45 000 හා රු. 5 000
(3) රු. 45 500 හා රු. 4 500 (4) රු. 50 000 හා රු. 5 000

28. පහත ගිණුම්කරණ වැරදිවලින් ශේෂ පිරික්සුමේ සමානතාවයට බලපෑමක් ඇති **නොකරන** ගනුදෙනුව කුමක්ද?

(1) රු. 5 000 ක දුන් වට්ටම්, ණයගැති ගිණුමේ පමණක් සටහන් කර ඇත.
(2) රු. 5 000 ක අත්පිට විකුණුම්, විකුණුම් ගිණුමේ රු. 500 ක් ලෙස සටහන් කර ඇත.
(3) රු. 5 000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් පොත්වලින් මඟහැරී ඇත.
(4) රු. 5 000 ක ගැණුම් ජ'නලයේ එකතුව ගැණුම් ගිණුමේ සටහන් කර නැත.

29. රු. 3 000ක ලද වට්ටම්, ලද වට්ටම් ගිණුමේ හරට සටහන් කිරීම නිවැරදි කිරීමට අදාල ද්විත්ව සටහන් වන්නේ,

(1) අවිනිශ්චිත ගිණුම - හර 3 000, ලද වට්ටම් ගිණුම - බැර 3 000
(2) ලද වට්ටම් ගිණුම - හර 6 000, අවිනිශ්චිත ගිණුම - බැර 6 000
(3) අවිනිශ්චිත ගිණුම - හර 6 000, ලද වට්ටම් ගිණුම - බැර 6 000
(4) ලද වට්ටම් ගිණුම - හර 3 000, අවිනිශ්චිත ගිණුම - බැර 3 000

පහත තොරතුරු භාවිතයෙන් අංක 30 හා 31 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- නැගෙනහිරු ක්‍රීඩා සමාජයේ 2025/12/31 න් අවසන් වර්ෂයේ පිළියෙල කළ ලැබීම් හා ගෙවීම ගිණුම පහත දැක්වේ.

නැගෙනහිරු ක්‍රීඩා සමාජය
2025/12/31 න් අවසන් වසර සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය | 43 000 | ක්‍රීඩා පිටි නඩත්තු වියදම් | 12 000 |
| සාමාජික මුදල් | 33 000 | ක්‍රීඩා උපකරණ | 20 000 |
| | | විදුලි වියදම් | 3 000 |
| | | ශේෂය ප/ගෙ | 41 000 |
| | 76 000 | | 76 000 |
| ශේෂය ඉ/ගෙ | 41 000 | | |

<u>අතිරේක තොරතුරු</u>

- එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1 000 කි. සාමාජිකයන් 5 දෙනෙකු 2025 වර්ෂයට සාමාජික මුදල් ගෙවා නැත.
- සියළු වියදම් වර්ෂයට අදාළව මුදලින් ගෙවා ඇත.

30. 2025/12/31 න් අවසන් වර්ෂයට අදාළව නැගෙනහිරු ක්‍රීඩා සමාජයේ සාමාජික මුදල් ආදායම වනුයේ,

(1) රු. 28 000 කි. (2) රු. 33 000කි.
(3) රු.36 000 කි. (4) රු. 38 000 කි.

31. 2025/12/31 න් අවසන් වර්ෂයේ නැගෙනහිරු ක්‍රීඩා සමාජයේ අතිරික්තය වනුයේ,

(1) රු. 3 000 කි. (2) රු. 18 000 කි.
(3) රු. 23 000 කි. (4) රු. 41 000 කි.

මල් පෝච්චි නිෂ්පාදනය කරන ආයතනයක ජනවාරි මාසයට අදාළව ලබාදෙන පහත තොරතුරු භාවිතයෙන් අංක 32 හා 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- නිෂ්පාදනය කරන ලද සිමෙන්ති මල් පෝච්චි සංඛ්‍යාව 100 කි.
- මුළු නිෂ්පාදන පිරිවැය රු. 180 000 කි.
- නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 43 000 කි.
- ඍජු ශ්‍රම පිරිවැය මල් පෝච්චියක් සඳහා රු. 300 කි.
- ප්‍රචාරණ වියදම රු. 5 000 කි.
- නිෂ්පාදන පිරිවැයෙන් 10% ක් ලාභ ඇතිව විකුණුම් මිල තීරණය කරයි.

32. මල් පෝච්චි නිෂ්පාදනයට අදාළ ජනවාරි මාසයේ ඍජු ද්‍රව්‍ය පිරිවැය වනුයේ,

(1) රු.107 000 කි. (2) රු. 131 700 කි.
(3) රු.132 000 කි. (4) රු. 137 000 කි.

33. මල් පෝච්චි සියල්ලම ජනවාරි මාසයේ අලෙවියෙන් ලද ලාභය වනුයේ,

(1) රු.1 800 කි. (2) රු. 13 000 කි.
(3) රු.18 000 කි. (4) රු. 198 000 කි.

පහත සඳහන් තොරතුරු භාවිත කරමින් අංක 34 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙනුයේ අංජනගේ ව්‍යාපාරයේ 2025/01/01 දිනට පැවති වත්කම් හා වගකීම් වේ.

| | | |
|---|---|---|
| **වත්කම්** | | |
| ඉඩම් | | 200 000 |
| ලී බඩු පිරිවැය | 60 000 | |
| (-) සමුච්චිත ක්ෂය | (6 000) | 54 000 |
| තොගය | | 12 000 |
| ණයගැති | | 24 000 |
| මුදල් | | 48 000 |
| **වගකීම්** | | |
| 12% බැංකු ණය | | 100 000 |
| ණයහිමි | | 30 000 |

වර්ෂය තුළ සිදුවූ ගනුදෙනු

| | | |
|---|---|---|
| අත්පිට ගැනුම් | | 180 000 |
| අත්පිට විකුණුම් | | 320 000 |
| ණයට විකුණුම් | | 60 000 |
| ගෙවූ විදුලි බිල | | 8 000 |
| විකුණුම් සේවක වේතන | | 36 000 |
| ණයගැති ලැබීම් | | 40 000 |
| ණයහිමියන්ට කළ ගෙවීම් | | 18 000 |
| ගෙවූ බැංකු ණය පොළී | | 7 000 |
| ලැබූ ගොඩනැගිලි කුලී | | 30 000 |
| ප්‍රචාරණය | | 4 000 |

අතිරේක තොරතුරු

- 2025/12/31 ඉතිරි තොගයේ වටිනාකම 18 000 කි.
- ණයගැතියන්ගෙන් රු. 2 000 ක් බොල්ණය කපා හල යුතු වේ.
- ලී බඩු සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතු වේ.
- 2025/01/01/ දින සිට මාසික රු. 3 000ට ව්‍යාපාරයේ ගොඩනැගිල්ලෙන් කොටසක් කුලියට දී ඇත.

34. මෙම ව්‍යාපාරයේ 2025/12/31 දිනට මුදල් ශේෂය වනුයේ,

(1) රු.48 000 කි. (2) රු. 165 000කි.
(3) රු.185 000 කි. (4) රු. 438 000 කි.

35. 2025/12/31 දිනට ණයගැති ශේෂය වනුයේ,

(1) රු. 42 000 කි. (2) රු. 44 000 කි. (3) රු. 60 000 කි. (4) රු. 84 000 කි.

36. 2025/12/31 න් අවසන් වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්වෙන බෙදාහැරීමේ වියදම්වල එකතුව වනුයේ,

(1) රු.36 000 කි (2) රු. 38 000 කි. (3) රු. 40 000 කි. (4) රු. 42 000 කි.

37. අංජනගේ ව්‍යාපාරයේ 2025/12/31 න් අවසන් වර්ෂයේ විකුණුම් පිරිවැය වන්නේ,

(1) රු. 162 000 කි. (2) රු. 174 000 කි. (3) රු. 192 000 කි. (4) රු. 230 000 කි.

38. 2025/12/31 න් අවසන් වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ පෙන්නුම් කරන බැංකු ණය පොළිය වන්නේ,

(1) රු. 5 000 කි. (2) රු. 7 000 කි. (3) රු. 12 000 කි. (4) රු. 19 000 කි.

39. 2025/12/31 දිනට මෙම ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන නිවැරදි අයිතමයක් වන්නේ,

(1) ණයහිමි ශේෂය රු 30 000 කි.
(2) 12% බැංකු ණය 93 000 කි.
(3) තොගය රු 12 000 කි.
(4) ලැබිය යුතු ගොඩනැගිලි ආදායම රු 6 000 කි.

40. 2025/12/31 දිනට අංජනගේ ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල ධාරණ අගය වන්නේ,

(1) රු. 248 000 කි. (2) රු. 254 000 කි. (3) රු. 260 000 කි. (4) රු. 314 000 කි.

සියලුම හිමිකම් ඇවිරිණි.

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, පෙරහුරු පරීක්ෂණය- 2025(2026)**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II** | **60 S I,II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

උපදෙස් :

❖ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව 1 කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද**, 11කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද** බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සිද්ධිය ඇසුරින් අංක (i) සිට (X) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලීය කළමනාකරණ උපාධිධාරියෙකු වන සචිමල්, ගම්පහ නගරයේ ප්‍රධාන පෙළේ පාසලක් අසල 10,11 ශ්‍රේණි සඳහා ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂයය ඉගැන්වීමේ උපකාරක පන්තියක් 'නැණ සවි ශිල්ප ශාලිකාව' නමින් පවත්වා ගෙන යයි.

ඔහුගේ ඉගෙනුම් කලාව, දක්ෂතාවය සහ සිසු විනය පිළිබඳ පවතින දැඩි අවධානය මෙන්ම සා.පෙළ විභාග ප්‍රතිඵල ඉහළ මට්ටමක පැවතීම යන කරුණු මත සිසු හා දෙමාපියන් අතර 'නැණ සවි ශිල්ප ශාලිකාව' ගම්පහ නගරයේ ජනප්‍රියව ඇත.

2025 දෙසැම්බර් 01 දින නැණ සවි අධ්‍යාපන ආයතනයේ තොරතුරු පහත දැක් වේ.

| | රු. |
|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 1 000 000 |
| ලී බඩු | 400 000 |
| කාර්යාල උපකරණ | 180 000 |
| 12% බැංකු ණය | 200 000 |
| මුදල් | 480 000 |

2025 දෙසැම්බර් 01 දින නැණ සවි අධ්‍යාපන ආයතනයට තාවකාලික සහායකයින් දෙදෙනෙකු රු.20,000ක මාසික වැටුපකට බඳවා ගන්නා ලදී.

| | රු. |
|---|---|
| පන්ති ගාස්තු ලෙස ලැබීම් | 400 000 |
| ලිපිද්‍රව්‍ය හා නිබන්ධන වියදම | 80 000 |
| ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 300 000 |
| ප්‍රචාරණ වියදම් | 10 000 |
| ගෙවූ විදුලි වියදම් | 6 000 |
| ප්‍රවාහන වියදම් | 20 000 |

2025 දෙසැම්බර් 31 දිනට පහත තොරතුරු සපයා ඇත.

- ලී බඩු හා කාර්යාල උපකරණ වාර්ෂිකව 12% බැගින් ක්ෂය කෙරේ.
- දෙසැම්බර් මාසයේ ලැබිය යුතු පන්ති ගාස්තු රු.20 000ක් වන අතර සේවක වැටුප් ගෙවා නොමැත.
- නැණ සවි ශිල්ප ශාලිකාව පුළුල් කිරීමට සිතූ සචිමල් සාමාන්‍ය පෙළ ප්‍රධාන විෂයයන් උගන්වන ගුරුවරු කිහිප දෙනෙකු 2026 ජනවාරි මාසයේදී බඳවා ගැනීමට තීරණය කරන ලදී.

(I) (අ) නැණ සවි අධ්‍යාපන ආයතනය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
(ආ) නිෂ්පාදිතයේ ස්වාභාවය අනුව මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගයට අයත්ද?

(II) (අ) මෙම ව්‍යාපාරය ඉටු කරන මිනිස් අවශ්‍යතාව නම් කර ඊට අදාළ වුවමනාවක් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්වයන් දෙකක් නම් කරන්න.

(III) (අ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් හා අවස්ථාවක් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට සච්මල් අදහස් කරන්නේ නම් ඊට අදාළ පනත/ප්‍රඥප්තිය කුමක්ද?

(IV) මෙම සිද්ධියේ සඳහන් වන කළමනාකරණ ක්‍රියාවලියේ සැලසුම්කරණයට හා සංවිධානකරණයට අයත් කාර්යයන් සඳහා නිදසුන බැගින් ලියන්න.

(V) (අ) මෙම ව්‍යාපාරයේ භාවිතා කරන මූලික පොත් දෙකක් හා ඊට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරන්න.
(ආ) 2025/12/01 දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න.

(VI) 2025/12/31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම වගකීම් 2 ක් අගයන් සහිතව දක්වන්න.

(VII) (අ) 2025/12/31 න් අවසන් මාසය සඳහා මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණද?
(ආ) දෙසැම්බර් මාසයේ ලී බඩු ක්ෂය ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල් සටහන ලියා දක්වන්න.

(VIII) 2025/12/31 දිනට මෙම ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

(IX) නැණ සවි අධ්‍යාපන ආයතනයේ 2025/12/31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(X) 2025/12/31 දිනට නැණ සවි අධ්‍යාපන ආයතනයේ හිමිකම කොපමණද?

**(ලකුණු 2×10 =20)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට **පමණක්** පිළිතුරු සපයන්න.)

2. (I) රාජ්‍ය සංස්ථාවක ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(II) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) එක් අවශ්‍යතාවයක් සපුරා ගැනීමට විවිධ ආකාරයේ වුවමනා භාවිතා කළ හැකිය.
(ආ) නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනය සඳහා ව්‍යාපාරයක කුලියට ගත් ගොඩනැගිල්ල උදාහරණයක් වේ.
(ඉ) සමුපකාර සමිතියක ආරම්භක අවම සාමාජික සංඛ්‍යාව දස දෙනෙක් වේ
(ඊ) ඇතැම් ව්‍යාපාරවල අයිතිකරුවන්ම කළමනාකරුවෝ ද වෙති.
(ලකුණු 02)

(III) ලක්මිණි විසින් සී/ස මිණිපා (පුද්) සමාගම නමින් පාවහන් නිෂ්පාදන ආයතනයක් පවත්වා ගෙන යයි.
(අ) සී/ස මිණිපා සමාගම සපුරාලන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද? (ලකුණු 01)
(ආ) ඉහත ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධානයේ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 01)

(IV) වෝල්ටර් මහතා විසින් පානීය ජලය බෝතල් කර විකිණීමේ ව්‍යාපාරයක් 'Cool Water' නමින් පවත්වා ගෙන යයි.
(අ) වෝල්ටර් මහතා මෙම ව්‍යාපාරයට දායකත්වය දක්වන ආකාර දෙකක් ලියන්න. (ලකුණු 01)
(ආ) කූල් වෝටර් (Cool Water) ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? හේතු දක්වන්න. (ලකුණු 01)
**(මුළු ලකුණු 08)**

3. (I) තොග වෙළඳාමේ ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(II) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
(අ) හරපතක් (Debit card) ලබා ගැනීම සඳහා බැංකු ගිණුමක් අත්‍යාවශ්‍ය නොවේ.
(අ) ජීවිත රක්ෂණය සඳහා හානිපූරණ මූලධර්මය බලනොපායි.
(ඉ) දුරකථන සංවාදයක් විද්‍යුත් සන්නිවේදනයට පමණක් අයත් වේ.
(ඊ) මාතර ප්‍රදේශයේ කුඩා ගංගාවක් හරහා නව පාලමක් ඉදිකිරීම, මාර්ගය යන ප්‍රවාහන මූලිකාංගයට අයත් වේ.
(ලකුණු 02)

(III) ජනිත් පෙරේරා ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යන අතර ව්‍යාපාර කටයුතුවල පහසුව සඳහා මහජන බැංකුවේ ජංගම ගිණුමක් ආරම්භ කර පවත්වා ගෙන යනු ලබයි. සියලුම ගෙවීම් කටයුතු ඔහු විසින් රේඛනය කරන ලද චෙක්පත්වලින් පමණක් සිදු කරයි.

(අ) චෙක්පත් රේඛනය කිරීම තුළින් අපේක්ෂා කරන්නේ කුමක්ද?
(ආ) ජංගම ගිණුමක් පවත්වා ගෙන යාමෙන් ව්‍යාපාරයකට ලැබෙන වාසි දෙකක් ලියන්න.

(ලකුණු 02)

(IV) විදුර තම වෑන් රථයෙන් අධිවේගී මාර්ගය හරහා මාතර බලා ගමන් කරමින් සිටියදී ඔහුට හදිසි අනතුරකට මුහුණ දීමට සිදු විය. එහිදී ඔහුගේ වෑන් රථයට හානි වූ අතර ඔහු දුරකථන ඇමතුමක් මඟින් ඔහුගේ රක්ෂණ සමාගම දැනුවත් කරන ලදී.

(අ) ඉහත සිදුවීම තුළ අන්තර්ගත රක්ෂණයට සම්බන්ධ වන පාර්ශ්වයන් උදාහරණ සහිතව නම් කරන්න.
(ආ) මෙහි දැක්වෙන ප්‍රවාහනයේ මූලිකාංග උදාහරණ සහිතව ලියා දක්වන්න.

(ලකුණු 02)

**(මුළු ලකුණු 08)**

4. (I) ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ දෙකක් ලියන්න. (ලකුණු 02)

(II) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.
(අ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් අතරින් ව්‍යාපාරයකට ආදායම් ගෙන දෙන එකම විචල්‍ය වන්නේ මිලය.
(ආ) සීමාසහිත සමාගමක සාමාන්‍ය කොටස් මිලදී ගන්නා තැනැත්තා එම සමාගමේ අයිතිකරුවන් බවට පත් වේ.
(ඉ) භාණ්ඩාගාර බිල්පත් දිගුකාලීන ආයෝජන මාර්ගයකි.
(ඊ) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා වෙළෙඳපලට ඉදිරිපත් කරන ඕනෑම දෙයක් නිෂ්පාදිතයක් වේ.

(ලකුණු 02)

(III) දුටුගැමුණු මහා විද්‍යාලයේ ශිෂ්‍යනායක මණ්ඩලය විසින් ගංවතුරෙන් ආපදා තත්ත්වයට පත් වූ සිසු දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. එම වැඩසටහනේ කාර්යයන් වෙන වෙනම පහත පරිදි පෙළගස්වන ලදී.

A. පාසල් උපකරණ එකතු කිරීම සඳහා කමිටුවක් පත් කිරීම.
B. මෙම කමිටුව නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
C. පාසල් උපකරණ ලබා දෙන දිනය, වේලාව හා ස්ථානය තීරණය කිරීම.
D. පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහන නිසි අයුරින් ක්‍රියාත්මක වන්නේදැයි තහවුරු කර ගැනීම.

ඉහත එක් එක් පියවරයන්ට අදාළ කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන් නම් කරන්න.

(ලකුණු 02)

(IV) (අ) ඉලක්ක වෙළෙඳපල යන්න හඳුන්වන්න. (ලකුණු 01)

(ආ) බිස්කට් නිෂ්පාදන ආයතනයක් නව බිස්කට් වර්ගයක් නිෂ්පාදනය කර බිස්කට් පැකට්ටුවක් රු.50ට අලෙවි කරන ලදී.
මෙම සිද්ධියේ සඳහන් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 01)

**(මුළු ලකුණු 08)**

## I I කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

5. (I) ව්‍යාපාරයක ආදායම යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

(II) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු දෙකකට අදාළ ද්විත්ව සටහන් පහත දැක් වේ. එම ද්විත්ව සටහන්වලට අදාළ ගනුදෙනුව ලියා දක්වන්න. (ලකුණු 02)

| | | |
|---|---|---|
| (අ) | මුදල් ගිණුම හර | රු. 9 000 |
| | දුන් වට්ටම් ගිණුම හර | රු. 1 000 |
| | ණයගැති ගිණුම බැර | රු.10 000 |
| (ආ) | ගැනිලි ගිණුම හර | රු.12 000 |
| | ගැණුම් ගිණුම බැර | රු.12 000 |

(III) හිරුක උපකරණ අලුත්වැඩියා කිරීමේ සේවා සපයන ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. 2026.01.01 දිනට හිරුකගේ ව්‍යාපාරයේ මුලු වත්කම් රු.400 000 ක්ද මුලු වගකීම් රු.150 000 ක්ද විය. මෙම ව්‍යාපාරයේ ජනවාරි මස පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක් වේ.

| | |
|---|---|
| 01/02 | රු.15 000ක උපකරණ අලුත්වැඩියා ද්‍රව්‍ය මිලදී ගැනීම. |
| 01/03 | හිරුකගේ නිවසේ දුරකථන බිල රු.6 500 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම. |
| 01/05 | උපකරණ අලුත්වැඩියා කිරීමෙන් රු.25 000ක ආදායමක් ලද අතර ඒ සඳහා වැය වූ උපකරණ අලුත්වැඩියා කිරීමේ තොගයේ වටිනාකම රු.10 000කි. |
| 01/07 | හිරුකගේ පෞද්ගලික මුදලින් රු.8 000ක ව්‍යාපාරයේ ණය හිමියෙකු පියවන ලදී. |

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු හිරුකගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම (පිළිතුරු සැපයීම) සඳහා පහත ආකාරයේ ආකෘතිය භාවිතා කරන්න.

| ගනුදෙනු අංකය | දිනය | වත්කම් (රු.) | හිමිකම් (රු.) | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| | 1/2 | +15 000 (තොගය)<br>-15 000 (මුදල්) | | |
| | | | | |
| | | | | |
| | | | | |

(ලකුණු 03)

(ආ) ඉහත ගනුදෙනුවලින් පසු 2026/01/07 දිනට හිරුකගේ ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න. (ලකුණු 01)

(IV) සෙහන්සාගේ ව්‍යාපාරයේ ණයට විකුණුම් පිළිබඳ තොරතුරු පහත දැක් වේ.

| දිනය | ඉන්වොයිසි අංකය | ගැණුම්කරු | ඉන්වොයිසි වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2026.01.06 | 014 | සජිත් | 18 000 |
| 2026.01.10 | 015 | අජිත් | 13 000 |
| 2026.01.18 | 016 | විජිත් | 30 000 |

ඉන්වොයිසි වටිනාකම රු.20 000 ඉක්මවන විට 10% ක වෙළෙඳ වට්ටමක් ලබා දීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු සෙහන්සාගේ විකුණුම් ජ'නලයේ සටහන් කිරීම.

(ආ) 2026.01.31 දිනට විකුණුම් ජ'නලයේ ගනුදෙනු ලෙජර ගිණුම්වල සටහන් කිරීම. (ලකුණු 04)

**(මුළු ලකුණු 12)**

6. (I) (අ) 'සුළු මුදල් අග්‍රිමය' යනු කුමක්ද?

(ආ) සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(ලකුණු 02)

(II) පොත් මුද්‍රණය කරනු ලබන 'සසිරි' පොත් ප්‍රකාශන ආයතනයේ 2026 ජනවාරි මාසයේ දරණ ලද වියදම් කිහිපයක් පහත දැක් වේ. පහත එක් එක් වියදමට අදාළ නිෂ්පාදන පිරිවැය මූලිකාංගය ලියන්න.

මුද්‍රණ යන්ත්‍ර ක්ෂය රු.8 000
කඩදාසි මිලදී ගැනීම සඳහා වියදම රු.55 000
පොත්වල කතෘන් සඳහා ගෙවූ මුදල රු.20 000
පොත් සැකසීම සඳහා භාවිතා කරන ගම් සඳහා රු.3 000 (ලකුණු 02)

(III) රුවනිගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයේ පිළියෙල කරනු ලැබූ බැංකු ගිණුම පහත දැක් වේ.

බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස.පි. අංකය | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. අංකය | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 01/01 | ශේෂය ඉ/ගෙ | | 22 000 | 01/03 | වැටුප් (490826) | | 15 000 |
| 01/05 | චෙක්පත(252431) | | 9 000 | 01/07 | නිමල් (490827) | | 5 000 |
| 01/08 | මුදල් | | 25 000 | 01/12 | කමල් (490828) | | 7 000 |
| 01/13 | චෙක්පත(351175) | | 31 000 | 01/17 | කඩකුලී(490829) | | 8 000 |
| 01/30 | චෙක්පත (127462) | | 10 000 | | | | |
| | | | | 01/31 | ශේෂය ප/ගෙ | | 62 000 |
| | | | 97 000 | | | | 97 000 |

අමතර තොරතුරු,
රුවනිගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසය සඳහා ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වඩා වෙනස් විය. බැංකු ප්‍රකාශනයේ හා බැංකු ගිණුමේ ආරම්භක ශේෂ සමාන විය. වෙනසට හේතු පහත දැක්වේ.

- 2026 ජනවාරි 31 දින වන විට අංක 127462 දරණ චෙක්පත උපලබ්ධි වී නොමැත.
- 2026 ජනවාරි 31 දින වන විට නිකුත් කළ චෙක් අංක 490827 දරණ චෙක්පත මෙතෙක් බැංකුවට ඉදිරිපත් වී නොමැත.
- 2026 ජනවාරි මාසය සඳහා බැංකුව විසින් අය කළ ගාස්තුව රු.1 000කි.

අවශ්‍ය වන්නේ,

2026 ජනවාරි මාසය සඳහා බැංකුව විසින් ව්‍යාපාරයට එවන ලද බැංකු ප්‍රකාශය පිළියෙල කිරීම. (ලකුණු 04)

(IV) බිමල්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව සමාන නොවීය. වෙනසට හේතු පහත දැක් වේ.

- ගොඩනැගිලි අලුත්වැඩියා වියදම රු.20 000 ගොඩනැගිලි ගිණුමේ හරට සටහන් කර තිබීම.
- ණයගැතියන්ගෙන් ලද රු.15 000ක් මුදල් සඳහා පිළියෙල කළ ලදුපත අස්ථානගත වී ඇත.
- බැංකු ණය ගැනීම රු.100 000 බැංකු ණය ගිණුමේ රු.10 000ක් ලෙස සටහන් කිරීම.

අවශ්‍ය වන්නේ,
ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් සංලක්ෂ්‍ය ද සහිතව පොදු ජ'නලයක ලියා දක්වන්න. (ලකුණු 04)

**(මුළු ලකුණු 12)**

7. (I) (අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ඇතුළත් වන ගිණුම්කරණ මූලිකාංග දෙක ලියන්න. (ලකුණු 02)

(ආ) අත්සර ක්‍රීඩා සමාජයේ 2025/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

- සාමාජික සංඛ්‍යාව 500 කි.
- මාසික සාමාජික ගාස්තුව රු.100 කි.
- වර්ෂය තුළ සාමාජික මුදල් ගෙවූ සාමාජික සංඛ්‍යාව 450 කි.

අවශ්‍ය වන්නේ,

ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල් හා ලැබීම් හා ගෙවීම් ගිණුම තුල ඇතුලත් කළ යුතු සාමාජික මුදල වෙන වෙනම ගණනය කරන්න. (ලකුණු 02)

(II) දින්සරගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2025.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක් වේ.

| විස්තරය | හර (රු) | බැර (රු) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 700 000 |
| ගැණුම් | 350 000 | |
| බඩු තොගය (2025/01/01) | 20 000 | |
| විකුණුම් | | 950 000 |
| ගෙන ඒමේ කුලී | 5 000 | |
| ණයගැතියෝ | 50 000 | |
| ණයහිමියෝ | | 62 000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 700 000 | |
| ලී බඩු හා උපකරණ (පිරිවැය) | 200 000 | |
| බෙදාහැරීම් රථ (පිරිවැය) | 600 000 | |
| බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2025/01/01 දිනට) | | 70 000 |
| 10% බැංකු ණය | | 200 000 |
| ගෙවූ ණය පොලී | 16 000 | |
| විදුලි ගාස්තු | 9 000 | |
| ප්‍රචාරණ වියදම් | 6 000 | |
| වැටුප් හා වේතන | 25 000 | |
| මුදල් ශේෂය | 7 000 | |
| බැංකු අයිරාව | | 10 500 |
| දුන් වට්ටම් | 2 000 | |
| ලද වට්ටම් | | 1 500 |
| බොල්ණය | 4 000 | |
| | 1 994 000 | 1 994 000 |

අමතර තොරතුරු

- 2025/12/31 දිනට ඉතිරි බඩු තොගය රු.50 000කි.
- ලී බඩු උපකරණ 10% හා බෙදාහැරීමේ රථ 20% වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- ණයගැතියන්ගෙන් රු.5 000 බොල් ණය ලෙස කපාහැරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

- දින්සරගේ ව්‍යාපාරයේ 2025/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04)
- 2025/12/31 දිනට දින්සරගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04)

**(මුළු ලකුණු 12)**

## අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය - 2025(2026) පෙරහුරු ප්‍රශ්න පත්‍රය
## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
## 1 කොටස - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1 | 11. | 3 | 21. | 4 | 31. | 3 |
| 2. | 3 | 12. | 2 | 22. | 2 | 32. | 1 |
| 3. | 1 | 13. | 3 | 23. | 3 | 33. | 3 |
| 4. | 4 | 14. | 2 | 24. | 4 | 34. | 3 |
| 5. | 3 | 15. | 3 | 25. | 4 | 35. | 1 |
| 6. | 4 | 16. | 3 | 26. | 2 | 36. | 4 |
| 7. | 2 | 17. | 3 | 27. | 1 | 37. | 2 |
| 8. | 3 | 18. | 4 | 28. | 3 | 38. | 3 |
| 9. | 2 | 19. | 1 | 29. | 3 | 39. | 4 |
| 10. | 3 | 20. | 2 | 30. | 4 | 40. | 1 |

## අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය - 2025 පෙරහුරු ප්‍රශ්න පත්‍රය
## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
## II කොටස - පිළිතුරු

1. (i) (අ) තනි පුද්ගල ව්‍යාපාර (ල. 01)
(ආ) සේවා සපයන (ල. 01)

(ii) (අ) අධ්‍යාපනය - උපකාරක පන්තිය/ ගුරුවරු/ නිබන්ධන/ පාසල් උපකරණ (ල. 01)

(ආ) අයිතිකරු - සවිමල්
සේවකයින්, දෙමාපියන්, සිසුන් (ල. ½ ×2 - 01)

(iii) <u>ශක්තීන්</u>

(අ)
- සවිමල් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ උපාධිධාරියෙකු වීම.
- සවිමල්ගේ ඉගැන්වීමේ කලාව හා දක්ෂතාවය (එකකට ල. 01)
- සවිමල්ගේ ජනප්‍රිය බව
- සවිමල්ගේ ප්‍රතිඵල ඉහළ මට්ටමක පැවතීම

<u>අවස්ථා</u>

නැණසවි අධ්‍යාපන ආයතනය ගම්පහ නගරයේ ජනප්‍රිය පාසලක් අසල පිහිටීම. (ල. 01)

(ආ) - 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත

- අදාල පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය (ල. 01)

(iv) සැලසුම්කරණය - සා/පෙළ ප්‍රධාන විෂයයන් සඳහා ගුරුවරු බඳවාගෙන ව්‍යාපාරය පුළුල් කිරීමට තීරණය කිරීම. (ල. 01)

සංවිධානකරණය - රු. 20 000 ක මාසික වැටුපකට සේවකයින් දෙදෙනෙකු බඳවා ගැනීම. (ල. 01)

(v) (අ) මුදල් පොත - ලදුපත හා ගෙවීම් වවුචරය (ල. 1/2)

ප්‍රධාන ජ'නලය - ජ'නල් වවුචරය (ල. 1/2)

| | |
|---|---|
| (ආ) මුළු වත්කම් - | 2 060 000 |
| (-) වගකීම් | (200 000) |
| 12/01 හිමිකම | 1 860 000 (ල. 01) |

(vi)

| | | |
|---|---|---|
| ගෙවිය යුතු බැංකු ණය පොළී | - | 2 000 |
| ගෙවිය යුතු සේවක වැටුප් | - | 40 000 |
| 2025/12/31 ජංගම වගකීම් | - | 42 000 (ල. 02) |

(vii) (අ) ඉඩම් ගොඩනැගිලි 1 000 000

| | | |
|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 1 000 000 | |
| පිරිවැය - සමු. ක්ෂය | | |
| ලී බඩු (400 000 – 4 000) | 396 000 | |
| කාර්යාල උපකරණ | 178 200 | |
| පිරිවැය - සමු. ක්ෂය (180 000 – 1800) | | |
| ධාරණ අගය | 1 574 200 | (ල. 01) |

(ආ)

ප්‍රධාන ජ'නලය

| | | |
|---|---|---|
| ලීබඩු ක්ෂය ගිණුම හර | 4 000 | |
| ලීබඩු ක්ෂය වෙන් කිරීමේ ගිණුම | | 4 000 |
| •(ලීබඩු ක්ෂය ගිණුම්ගත කිරීම) | | |
| $(400\ 000\times\frac{12}{100}\times\frac{1}{12}) = 4\ 000$ | | |

(ල. 01)

(viii)

මුදල් පොත

| | | | |
|---|---|---|---|
| ශේෂය | 480 000 | ගොඩ. අලුත්වැඩියා වියදම් | 300 000 |
| පන්ති ගාස්තු | 400 000 | ප්‍රචාරණය | 10 000 |
| | | විදුලි වියදම් | 6 000 |
| | | ප්‍රවාහන | 20 000 |
| | | ශේෂය | 544 000 |
| | 880 000 | | 880 000 |

මුදල් පොත පිළියෙල කර ශේෂය ගණනය කර ඇත්නම් ල. 02 කි. ශේෂය පමණක් පිළිතුරු ලෙස ඇත්නම් ල. ½ ක් දෙන්න.

(ix)

| | | |
|---|---|---|
| ආදායම් | | |
| පන්ති ගාස්තු | | 420 000 |
| (-)වියදම් | | |
| ණය පොළී | 2 000 | |
| සේවක වැටුප් | 40 000 | |
| ලීබඩු ක්ෂය | 4 000 | (ල.01) |
| උපකරණ ක්ෂය | 1 800 | |
| ලිපි ද්‍රව්‍ය / නිබන්ධන | 80 000 | |
| ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් | 300 000 | |
| ප්‍රචාරණය | 10 000 | |
| විදුලිය | 6 000 | |
| ප්‍රවාහනය | 20 000 | 463 800 |
| ශුද්ධ අලාභය | ල. 01) | 43 800 |

(x) 2025/12/31 හිමිකම

| | |
|---|---|
| 2025/12/01 හිමිකම | 1 860 000 |
| (-) ශුද්ධ අලාභය | (43 800) |
| | 1 816 200 |

(ල. 02)

- ආරම්භක හිමිකමට ශුද්ධ අලාභය අඩුකර පෙන්විය යුතුය. (ල.02)

2. (i) 1. අයිතිය හා පාලනය රජය සතුවීම.
2. නෛතික පුද්ගලභාවයක් තිබීම.
3. අඛණ්ඩ පැවැත්මක් තිබීම.
4. විශේෂ පනතක් හෝ පවත්නා පොදු පනතක් යටතේ ආරම්භ කළ හැකිවීම.

(1×2 = ල. 02)

(ii) (අ) සත්‍යයි.
(ආ) සත්‍යයි.
(ඉ) සත්‍යයි.
(ඊ) සත්‍යයි.

(1/2×4 = ල. 02)

(iii) (අ) ඇඳුම් (ල. 01)
(ආ) 1. සමාගම් පනත යටතේ ස්ථිපිත කිරීම.
2. අඛණ්ඩ පැවැත්මක් තිබීම.
3. සීමිත වගකීම
4. ලියාපදිංචිය අනිවාර්ය වීම.
5. කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය රැස්කර ගත හැකිවීම. (1/2×2 = ල. 01)

(iv) (අ)
- ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සැපයීම.
- ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුව හා කැපවීම.
- ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණය

(ආ) ලියාපදිංචි කළ යුතුය. (ල. 1/2)
අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන නිසා ලියාපදිංචිය අනිවාර්යය වේ. (ල. 1/2)

3. (i)
- නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිලදී ගැනීම.
- බොහෝ විට භාණ්ඩ විශාල ප්‍රමාණයක් එකවර විකිණීම.
- භාණ්ඩ වර්ග කිහිපයක් පමණක් අලෙවි කිරීම.
- සාපේක්ෂව ඒකකයකක විකුණුම් මිල අඩුවීම.
- බහුලව වෙළෙඳ වට්ටම් ලබාදීම. එනම් භාණ්ඩවල ලකුණු කළ මිලෙන් යම් ප්‍රතිශතයක් අඩුකර විකිණීම.

(ii) (අ) අසත්‍යයි.
(ආ) සත්‍යයි.
(ඉ) අසත්‍යයි.
(ඊ) සත්‍යයි.

(iii) (අ) - චෙක්පතට වැඩි ආරක්ෂාවක් ලබාදීම සඳහා

(ආ) - චෙක්පත් මඟින් ගෙවීම් කල හැකිවීම.
- බැංකු අයිරා පහසුකම් ලබාගත හැකිවීම.

(iv) (අ) රක්ෂිතයා - විදුර
රක්ෂකයා - රක්ෂණ සමාගම

(ආ) මාර්ගය - අධිවේගි මාර්ගය
මාධ්‍ය - වෑන් රථය

4. (i) 1. ඉතුරුම් ගිණුමකට සාපේක්ෂව ඉහළ අනුපාතයක් යටතේ පොළී හිමිවීම.
2. කල් පිරුණු පසු හෝ ඊට පෙර හෝ අවශ්‍ය නම් මුදල් ආපසු ලබාගත හැකිවීම.
3. ස්ථාවර තැන්පතු සහතිකය ඇපයට තබා ණය මුදලක් ලබාගත හැකිවීම.
4. සුරක්ෂිත ආයෝජන මාර්ගයක් වීම.

(1×2 = ල. 02)

(ii) (අ) සත්‍යයි.
(ආ) සත්‍යයි.
(ඉ) අසත්‍යයි.
(ඊ) සත්‍යයි.

(1/2×4 = ල. 02)

(iii) A. සංවිධානකරණය
B. මෙහෙයවීම
C. සැලසුම්කරණය
D. පාලනය

(1/2×4 = ල. 02)

(iv) (අ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ෂණීය ලෙස මෙන්ම ලාභදායිව තෘප්තිමත් කළ හැකි පාරිභෝගිකයන්ගෙන් සමන්විත වෙළෙඳපොළ කොටස ඉලක්ක වෙළඳපල වේ.

(ල.01)

(ආ) නිෂ්පාදිතය

මිල

(ල.01)

5. (i) අයිතිකරුවන් යොදන ප්‍රාග්ධනය නිසා හිමිකමෙහි සිදුවන වැඩිවීම හැර හිමිකමෙහි සිදුවන අනෙකුත් වැඩිවීම් ආදායම් ලෙස හැඳින්වේ. (ල.01)

(ii) (අ) රු. 10 000 ක ණය පියවීමේදී ණයගැතියන්ගෙන් ලද මුදල රු. 9 000 කි. දුන් වට්ටම රු. 1 000

හෝ

10% වට්ටමකට යටත්ව ණයගැතියන්ගෙන් ලද මුදල රු. 9 000 කි. දුන් වට්ටම් රු. 1 000

හෝ

ණයගැතියන්ගෙන් මුදල් ලැබීම රු. 9 000

දුන් වට්ටම රු. 1 000

(ආ) රු. 12 000 ක භාණ්ඩ ගැනිලි සිදු කිරීම. හෝ පෞද්ගලික ප්‍රයෝජනයට භාණ්ඩ ගැනිලි සිදු කිරීම.

(iii)

| ගනුදෙනුව | දිනය | වත්කම් (රු) = | හිමිකම් (රු) + | වගකීම් (රු) |
|---|---|---|---|---|
| I. | 1/2 | + 15 000 (තොගය)<br>- 15 000 (මුදල්) | | |
| II. | 1/3 | - 6 500 (මුදල්) | - 6 500 (ගැනිලි) | (ල. 01) |
| III. | 1/5 | + 25 000 (මුදල්)<br>- 10 000 (තොගය) | + 15 000 (ලාභය) | (ල. 01) |
| IV. | 1/7 | | + 8 000<br>(අමතර ප්‍රාග්ධනය) | - 8 000<br>(ණයහිමියා)<br>(ල. 01) |

(ල. 03)

(ආ) 2026/01/07 දිනට හිමිකම

වත්කම් - වගකීම්

ආරම්භක හිමිකම = රු. 250 000 (400 000 – 150 000)

- 6 500
+ 15 000
+ 8 000
266 500 (ල. 01)

(iv)

විකුණුම් ජ'නලය

| දිනය | ඉ.අ. | ගනුදෙනුකරු | වටිනාකම | ලෙ.පි. | |
|---|---|---|---|---|---|
| 2026/01/06 | 014 | සජිත් | 18 000 | | (ල. ½) |
| 2026/01/10 | 015 | අජිත් | 13 000 | | (ල. ½) |
| 2026/01/18 | 016 | විජිත් | 27 000 | | (ල. ½) |
| 2026/01/31 | | විකුණුම් ගිණුමට බැර කළා | 58 000 | | (ල. ½) |

විකුණුම් ගිණුම

| දිනය | විස්තරය | සපි | වටිනාකම | දිනය | විස්තරය | සපි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2020/01/31 | විවධ ණයගැති | | 58 000 |

(ල. ½)

සජිත්ගේ ගිණුම

| දිනය | විස්තරය | සපි | වටිනාකම | දිනය | විස්තරය | සපි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 2026/01/06 | විකුණුම් ගිණුම | | 18 000 | | | | |

(ල. ½)

අජිත්ගේ ගිණුම

| දිනය | විස්තරය | සපි | වටිනාකම | දිනය | විස්තරය | සපි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 2026/01/10 | විකුණුම් ගිණුම | | 13 000 | | | | |

(ල. ½)

විජිතගේ ගිණුම

| දිනය | විස්තරය | සපි | වටිනාකම | දිනය | විස්තරය | සපි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 2026/01/18 | විකුණුම් ගිණුම | | 27 000 | | | | |

(ල. ½)

6.

(i) (ආ) ප්‍රධාන මුදල් භාරකරු විසින් යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා සුළු මුදල් භාරකරුට ලබා දෙන යම් නිශ්චිත මුදලයි.

(ලකුණු 1)

(ආ) සුළු මුදල් පොත (හර)

මුදල් පොත (බැර)

(ii) (i) වක්‍ර වෙනත් (ල. ½)

(ii) ඍජු ද්‍රව්‍ය (ල. ½)

(iii) ඍජු වෙනත් (ල. ½)

(iv) වක්‍ර ද්‍රව්‍ය (ල. ½)

(iii)

2026 ජනවාරි මාසය සඳහා බැංකු ප්‍රකාශය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 1/1 | ශේෂය | | | 22 000 (ල.½) |
| 1/3 | චෙක් (490826) | 15 000 | | 7 000 |
| 1/6 | චෙක් තැන්පතු (252431) | | (ල.½) 9 000 | 16 000 |
| 1/8 | මුදල් | (ල.01) | (ල.½) 25 000 | 41 000 |
| 1/15 | චෙක් තැන්පතු (351175) | | (ල.½) 31 000 | 72 000 |
| 1/16 | චෙක් (490828) | 7 000 | | 65 000 |
| 1/20 | චෙක් (490829) | 8 000 | | 57 000 |
| 1/31 | බැංකු ගාස්තු | (ල.½) 1 000 | | (ල.½) 56 000 |

- චෙක්පත් තැන්පත්, තැන්පත් කල හා ගෙවීම් කල දින වෙනස් විය හැකිය.

උපලබ්ධි නොවූ චෙක්පත හා ඉදිරිපත් නොකළ චෙක්පත සටහන් කර ඇත්නම් තැන්පත් කළ චෙක් හා ඉදිරිපත් කළ ගෙවීම් සිදුකළ චෙක්පත් සටහන් කිරීමට අදාළ ලකුණු කිසිවක් හිමි නොවේ.

(iv)

පොදු ජ'නලය

| දිනය | ජ.ව.අංකය | විස්තරය | ලෙ.පි | හර | බැර |
|---|---|---|---|---|---|
| | | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් (හර)<br>ගොඩනැගිලි ගිණුම<br>(ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් රු.20000 ගොඩනැගිලි ගිණුමේ සටහන් වී තිබීම නිවැරදි කිරීම.) | | 20 000 | 20 000<br>(ල. 01) |
| | | මුදල් ගිණුම (හර)<br>ණයගැති ගිණුම<br>(ණයගැතියන්ගෙන් ලද මුදල් රු.15000 සටහන් නොවීමේ වරද නිවැරදි කිරීම) | | 15 000 | 15 000<br>(ල. 01) |
| | | අවිනිශ්චිත ගිණුම (හර)<br>බැංකු ණය ගිණුම<br>(බැංකු ණය ගිණුමේ රු.90000ක් අඩුවෙන් සටහන් කිරීම නිවැරදි කිරීම) | | 90 000 | 90 000<br>(ල. 01) |

(සංලක්ෂ සඳහා ලකුණු ½)

7. (i) (අ) ආදායම්
වියදම් (ල. 01)

(ල. 1/2) (ල. 1/2)
1 200 × 500

(ආ) ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කලයුතු සාමාජික මුදල <u>රු. 600 000</u> (ල. 01)

(ල. 1/2) (ල. 1/2)
1 200 × 450

ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කලයුතු සාමාජික මුදල <u>රු. 540 000</u> (ල. 01)

(ii) 1.

දින්සරගේ වෙළෙඳ ව්‍යාපාරයේ
2025/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ අලාභ ප්‍රකාශය ½

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 950 000 |
| <u>(-)විකුණුම් පිරිවැය</u> | | | |
| ආරම්භක තොගය | | 20 000 | |
| (+) ගැනුම් | | 350 000 | |
| ගෙනඒමේ කුලී | | 5 000 | |
| වි.ඉ.කල තොගයේ පිරිවැය | | 375 000 | |
| (-) අවසන් තොගය | | (50 000) | ½ |
| විකුණුම් පිරිවැය | | 325 000 | (325 000) |
| දළ ලාභය | | | ½ 625 000 |
| <u>වෙනත් ආදායම්</u> | | | |
| ලද වට්ටම් | | 1 500 | 1 500 |
| | | | 626 500 |
| <u>බෙදාහැරීමේ වියදම්</u> | | | |
| බෙදාහැරීමේ රථ ක්ෂය | 120 000 | ½ | |
| බොල්ණය | 9 000 | ½ | |
| දුන් වට්ටම් | 2 000 | | |
| ප්‍රචාරණය | 6 000 | 137 000 | |
| <u>පරිපාලන වියදම්</u> | | | |
| ලීබඩු හා උපකරණ ක්ෂය | 20 000 | ½ | |
| වැටුප් හා වේතන | 25 000 | | |
| විදුලිය | 9 000 | 54 000 | |
| <u>වෙනත් වියදම්</u> | | | |
| <u>මූල්‍ය වියදම්</u> | | | |
| බැංකු ණය පොළිය | 20 000 | 20 000 | (211 000) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා | | ½ | ½ 415 500 |

දින්සරගේ වෙළෙඳ ව්‍යාපාරයේ
2025/12/31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ½

| ජංගම නොවන වත්කම් | පිරිවැය | ස.ක්ෂය | ධාරණ අගය ½ |
|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 700 000 | - | 700 000 |
| ලීබඩු හා උපකරණ | 200 000 | 20 000 | 180 000 |
| බෙදාහැරීමේ රථ | 600 000 | 190 000 | 410 000 |
| | 1 500 000 | 210 000 | 1 290 000 |
| | | ½ | ½ |
| ජංගම වත්කම් | | | |
| අවසන් තොගය | | 50 000 | ½ |
| ණයගැතියෝ | | 45 000 | ½ |
| මුදල් | | 7 000 | 102 000 |
| මුළු වත්කම් | | | 1 392 000 |
| හිමිකම් හා වගකීම් | | | |
| ප්‍රාග්ධනය | | 700 000 | |
| (+) ශුද්ධ ලාභය | | 415 500 | 1 115 500 |
| | | ½ | |
| (-) ගැනිලි | | | |
| ජංගම නොවන වගකීම් | | | |
| 10% බැංකු ණය | | 200 000 | 200 000 |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | | 62 000 | |
| බැංකු අයිරාව | | 10 500 | |
| ගෙවිය යුතු බැංකු ණය පොළී | | 4 000 | 76 500 |
| මුළු වගකීම් හා හිමිකම් | | | ½ 1392 000 |